මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/98** **2025.05.08**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

## මැතිවරණ කොමිෂන් සභාවේ ස්තුතිය

පළාත් පාලන ආයතන 339ක් සඳහා නියෝජිතයන් තෝරාපත් කර ගැනීම පිණිස ඊට අදාළ දැන්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කළ 2025.03.03 දින සිට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවත් වූ 2025 මැයි මස 06 වන දින දක්වා වූ කාලය තුළ සියලුම ව්‍යවස්ථාපිත කාර්යයන් මැනවින් සංවිධානය කළ මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය, සියලුම තේරීම්භාර නිලධාරීන්, දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඔවුන්ගේ කාර්ය මණ්ඩල;

සමස්ත රාජ්‍ය යාන්ත්‍රණයේ ස්වකීය පරිපාලන මෙන්ම සංවර්ධන කාර්යයන් ද ඡන්ද විමසීම් නීතිරීතිවලට අනුකූලවන පරිදි හා මැතිවරණ ක්‍රියාවලියට බාධාවක් නොවන පරිදි සංවිධානය කර ගැනීමට හැකි වන පරිදි ක්‍රියා කළ ජනාධිපති ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම් ඇතුළු සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් ආණ්ඩුකාරවරුන්, පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු කාර්ය මණ්ඩල, රාජ්‍ය ආයතන හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්, පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ඇතුළු පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල, ත්‍රිවිධ හමුදාපතිවරු ඇතුළු කාර්ය මණ්ඩල, රජයේ මුද්‍රණාලයාධිපති ඇතුළු කාර්ය මණ්ඩලය, තැපැල්පති ඇතුළු කාර්ය මණ්ඩලය, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය, ආපදා කළමණාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලය;

ඡන්ද පොළ, ගණන් කිරීමේ, ප්‍රතිඵල වගුගත කිරීමේ හා එකී කාර්යයන්ට සහය සේවා සැපයීමේ රාජකාරී කටයුතු ඉටු කළ සියලුම නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩල හා ග්‍රාම නිලධාරීන්;

මැතිවරණ කාර්යයන් හා සබැඳි යටිතල පහසුකම් සම්පාදනය කළ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ, විදුලිබල මණ්ඩලයේ, ශ්‍රී ලංකා ටෙලිකොම්, ඛනිජ තෙල් සංස්ථාවේ, මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලයට සහ කුලීරථ සමාගම්/ කුලී රථ හිමිකරුවන්;

මැතිවරණ කොමිෂන් සභාවේ නිල නිවේදන දැන්වීම් හා අත්‍යවශ්‍ය තොරතුරු ප්‍රසිද්ධ කිරීමට සමස්ථ ඡන්ද විමසීම් ක්‍රියාවලිය පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමට කටයුතු කළ සියලුම රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ප්‍රධානීන් ප්‍රවෘත්ති සංස්කාරකවරුන් හා ප්‍රවෘත්ති කර්තෘවරුන්;

තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ මැතිවරණ ප්‍රතිඵල සකස් කිරීමට සහාය දැක් වූ කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල, හරිත සරසවිය, තාක්ෂණ අමාත්‍යාංශය හා තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ ප්‍රධානීන් ඇතුළු කාර්ය මණ්ඩලය; සහ

තරග කරන ලද දේශපාලන පක්ෂවල ලේකම්වරුන්, ස්වාධීන කණ්ඩායම් නායකයන්, සියළුම අපේක්ෂකයන් හා දේශීය මැතිවරණ නිරීක්ෂණ සංවිධාන වෙත කොමිෂන් සභාවේ කෘතඥතාව හිමි වේ.

මැතිවරණ කටයුතු නිසි ලෙස සංවිධානය කොට නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහ මැතිවරණ කොමිෂන් සභාව කෙරෙහි ශ්‍රී ලාංකීය ජනතාව තුළ තිබෙන විශ්වාසය තවදුරටත් තහවුරු කිරීමට ඉහතින් නිශ්චිතව සඳහන් නොවුණ ද නන් අයුරින් සහාය දැක් වූ සැමට මැතිවරණ කොමිෂන් සභාවේ ගෞරවයත් ප්‍රශංසාවත් පිරිනමනු කැමැත්තෙමි.

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)